www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

Asmt_CIT_003_S

ශ්‍රී ලංකා දේශීය ආදායම්
இலங்கை உள்நாட்டு இறைவரி
Sri Lanka Inland Revenue

සංස්ථාපිත ආදායම් වාර්තාව පිරවීම සඳහා උපදෙස් මාලාව

තක්සේරු වර්ෂය
2021/2022

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

ආදායම් වාර්තාව සම්පූර්ණ කිරීමට පෙර, ඔබ විසින් මෙම උපදෙස් මාලාව කියවන්න. වැඩිදුර විස්තර දේශීය ආදායම් දෙපාර්තමේන්තු (IRD) වෙබ් අඩවිය - www.ird.gov.lk හරහා ලබාගත හැකිය.

1. හැඳින්වීම

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 93(1) වගන්තිය ප්‍රකාරව, සෑම තැනැත්තෙක්ම සෑම තක්සේරු වර්ෂයක්ම අවසාන වීමෙන් පසුව මාස අටකට නොවැඩි කාලයක් තුළ එම තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාවක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගොනු කළ යුතුය. ඒ අනුව, 2022 මාර්තු 31 දිනෙන් අවසන් වන තක්සේරු වර්ෂය (2021/2022) සඳහා ආදායම් වාර්තාව 2022නොවැම්බර් 30 දින හෝ එදිනට පෙර ගොනු කළ යුතුය.

දේශීය ආදායම් පනතේ, 126(2) වන වගන්තියේ විධිවිධාන පරිදි, කොමසාරිස් ජනරාල්වරයා විසින් වාර්තාව සඳහා ආකෘතිය, වාර්තාව මගින් ඉදිරිපත් කළ යුතු තොරතුරු සහ තිබේ නම්, වාර්තාව සමග ගොනු කළ යුතු ඇමුණුම්, සහ ගොනු කළ යුතු ආකාරය නිශ්චිතව දක්වනු ලැබිය හැකිය.

ඒ අනුව, අංක Asmt CIT 002A ආකෘතිය සහ අංක Asmt – CIT- 002B ආකෘතියෙන් දැක්වෙන උපලේඛන ඇතුළුව අංක Asmt CIT 001 ආකෘතිය, හවුල් ව්‍යාපාර හැර යම් අස්ථිත්වයක් සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති ආදායම් වාර්තාව (සංස්ථාපිත ආදායම් වාර්තාව) වේ. එබැවින්, 2 වන පරිච්ඡේදය යටතේ සඳහන් කර ඇති අස්ථිත්ව, 2021/2022 තක්සේරු වර්ෂය සඳහා ඉහතින් සඳහන් කළ ආකෘති පත්‍රවල ආදායම් වාර්තාව සැපයීමේදී දේශීය ආදායම් පනතේ විධිවිධාන සමග අනුගත විය යුතුය.

2. සංස්ථාපිත ආදායම් වාර්තාව ලබාදිය යුතු අස්ථිත්ව

(a) වාසික හෝ නිර්වාසික සීමිත වගකීම් සහිත සමාගම්
(b) වාසික හෝ නිර්වාසික භාර
(c) පුණ්‍ය ආයතන
(d) ඒකක භාර හෝ අන්‍යෝන්‍ය අරමුදල්

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

(e) රාජ්‍ය නොවන සංවිධාන
(f) රාජ්‍ය සංස්ථා
(g) සමාජශාලා, සමිති හෝ සංගම්
(h) ඕනෑම රජයේ ආයතනයක්
(i) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල, අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදල, සමාපන අරමුදල හෝ පාරිතෝෂික අරමුදල
(j) හවුල් ව්‍යාපාර හැර වෙනත් ඕනෑම අස්ථිත්වයක්

3. ගොනු කිරීමේ ක්‍රමය

2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධිත) පනතින් සංශෝධනය කර ඇති පරිදි දේශීය ආදායම් පනතේ 113 (1අ) වගන්තිය ප්‍රකාරව, 2021 අප්‍රේල් 01 වන දා සිට ක්‍රියාත්මක වන පරිදි බදු වාර්තා (වාර්තා ඉලෙක්ට්‍රොනිකව ගොනු කිරීම) ඊ-ගොනු කිරීම (e-filing),

(අ) ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගම් (සියලුම වාසික සීමිත වගකීම් සහිත සමාගම්);

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති සමාගම් (සියලුම නිර්වාසික සීමිත වගකිම් සහිත සමාගම්); සහ

(ඇ) රාජ්‍ය සංස්ථා සඳහා අනිවාර්ය වේ.

එබැවින්, එම අස්ථිත්ව මෙම තක්සේරු වර්ෂය සඳහා හා ඉන් පසුව මුද්‍රිත නිශ්චිත ආකෘති පත්‍ර භාවිතා කරමින් ලිඛිතව ඔවුන්ගේ ආදායම් වාර්තා සැපයීමට හිමිකම් නොලබයි.

තවද, දේශීය ආදායම් පනතේ 113(4) වගන්තියේ විධිවිධාන පරිදි, අනෙකුත් තැනැත්තන් විසින් පෙර තක්සේරු වර්ෂය (2020/2021) සඳහා ඔවුන්ගේ ආදායම් වාර්තා(ඊ-ගොනු කිරීම හරහා) දැනටමත් ගොනු කර ඇත්නම්, එම තැනැත්තන්ද ඊ-ගොනු කිරීම හරහා ඔවුන්ගේ ආදායම් වාර්තා ගොනු කළ යුතුය.

ඊ-ගොනු කිරීම සඳහා දේශීය ආදායම් වෙබ් අඩවිය හරහා පහසුකම් සකස් කර ඇත. කරුණාකර වැඩිදුර තොරතුරු

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

සඳහා දේශීය ආදායම් වෙබ් අඩවියේ (www.ird.gov.lk) ඇති කඩිනම් උපදෙස් බලන්න.

ඉහතින් සඳහන් කරන ලද ඊ-වාර්තා සැපයීමට යටත් වන අස්ථිත්ව හැර අනෙකුත් අස්ථිත්ව තම ආදායම් වාර්තා කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද මුද්‍රිත ආකෘති පත්‍රවල ලිඛිතව හෝ ඊ-ගොනු කිරීම හරහා ගොනු කළ යුතුය. එවැනි බදු ගෙවන්නන්ද ආදායම් වාර්තා මාර්ගගත ක්‍රමය භාවිතා කරමින් ඊ-ගොනු කිරීමට උනන්දු විය යුතුය.

4. සංස්ථාපිත ආදායම් වාර්තාවල අනුමත ආකෘති පත්‍ර

අනුමත කළ ආකෘති පත්‍ර පහත පරිදි සකස් කර ඇත.

(අ) ආදායම් වාර්තාව - අ කොටස

(i) කොටස - 01: ලැබීම් හා ලාභ ප්‍රකාශය
(ii) කොටස - 02: ප්‍රකාශනය
(iii) ආදායම් වාර්තාව සඳහා උපලේඛන

(ආ) මූල්‍ය තොරතුරු - ආ කොටස

(i) උපලේඛනය - 08: ගණනය කිරීමේ පත්‍රිකා
(ii) උපලේඛනය - 09: මූල්‍ය තොරතුරු

වාර්තාවේ අ කොටස උපලේඛන එකොළහකින් එනම් උපලේඛන 1, 2, 2ආ, 3, 4, 5, 6 (6අ+6ආ), 7, 7අ, 7ආ වලින් සමන්විත වේ. එම සියලුම උපලේඛන භාරදීම අනිවාර්ය වේ. අනිවාර්ය උපලේඛන, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වන ලද ආදායම් වාර්තාවේ අනුමත කළ ආකෘති පත්‍රවල අඛණ්ඩ කොටසකි. එසේ වුවද, උපලේඛන 1, 2ආ, 3, 5, 6 (6අ+6ආ), 7අ, හා 7ආ ආදායම් වාර්තා ගොනු කිරීමේදී අදාළ නොවේ නම්, එම උපලේඛන ඔබ විසින් භාරදීමට අවශ්‍ය නොවේ. එවැනි අවස්ථාවකදී, කරුණාකර උපලේඛනවල පළමු පිටුවේ (ආදායම් වාර්තාවේ අ කොටසෙහි) දී ඇති වගුවේ උපලේඛනයේ අදාලත්වය "(X)" ලෙස ලකුණු කරන්න. එම වගුවේ "(X)" ලෙස ලකුණු කොට, එය එම ආදායම් වාර්තාව සමග භාරදෙන ලද තැනැත්තා, එම අනිවාර්ය උපලේඛන භාරදුන්

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

තැනැත්තකු ලෙස සලකනු ලැබේ. එසේ වුවද, ඉහත සඳහන් කළ වගුව සමග උපලේඛන 2, 4 හා 7 භාරදීම අනිවාර්ය වේ.

දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව ගිණුම් ලාභය ගලපමින් සකස් කරන ලද ඔබගේ බදු ආගණනය කිරීම ඔබ විසින් අමුණා ඇත්නම්, මෙම තක්සේරු වර්ෂය සඳහා උපලේඛන 8 භාරදීම අනිවාර්ය නොවේ. එසේ වුවද, මූල්‍ය තොරතුරුවල උපලේඛන සම්පූර්ණ කර වාර්තා ආකෘති පත්‍රවලට අමුණන ලෙස ඔබට උපදෙස් දෙනු ලැබේ.

යම් අවස්ථාවකදී, ආදායම් වාර්තාවේ යම් කොටුවකට වටිනාකම පිරවීමට වෙනත් උපලේඛන සමග සම්බන්ධ වී ඇති විට, අදාළ උපලේඛන පිරවිය යුතු අතර වාර්තාව සමග සැපයිය යුතුය.

5. වාර්තාවේ අ කොටසෙහි 02(1) වන කොටස

2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධනය කර ඇති පරිදි, දේශීය ආදායම් පනතෙහි 126(5) වන වගන්තිය ප්‍රකාරව, , අනුමත කළ ගණකාධිකාරීවරයකුද ඇතුළු, යම් තැනැත්තකු විසින් ගෙවීමක් සඳහා වාර්තාව හෝ වාර්තාවේ කොටසක් සකස්කර ඇති අවස්ථාවකදී එම තැනැත්තා, එම වාර්තාව සකස් කිරීමේදී ඔහු සම්බන්ධ වූ ප්‍රමාණය, පරීක්ෂා කරන ලද ලේඛන සහ පදනම් කරගත් තොරතුරු දක්වමින් වෙනම සහතික කළ යුතුය. ඒ අනුව, ඔබ විසින් අදාළ කොටුවෙහි "✓" ලකුණ යෙදීම අවශ්‍ය වේ. ඔබ "ඔව්" යන්න සඳහන් කළ කොටුවෙහි "✓" යන්න යොදා නිබේ නම්, 2 වන කොටසෙහි 1 වන අයිතමය යටතේ එම තැනැත්තාගේ විස්තර පිරවීමට අවශ්‍ය වන අතර ඔබගේ වාර්තාව හෝ වාර්තාවේ කොටසක් සකස් කළ එම තැනැත්තා විසින් නිකුත් කරන ලද සහතික අමුණන්න. ඔබගේ වාර්තාව හෝ වාර්තාවේ කොටසක් සකස් කිරීමට එක් තැනැත්තකුට වඩා සම්බන්ධ වී ඇති අවස්ථාවකදී, කරුණාකර 2 වන කොටසේ 1 වන අයිතමය යටතේ අවශ්‍ය කරන විස්තර ඇතුළත් කිරීමට වෙනම පත්‍රිකාවක් භාවිතාකළ යුතු අතර, සියලුම සහතික එම පත්‍රිකාව සමග ආදායම් වාර්තාවට අමුණන්න. එම සහතික කිරීම්, ඔබගේ වාර්තාවේ අත්‍යාවශ්‍ය අංගයක් ලෙස සලකනු ලැබිය යුතුය.

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

6. බදු ගෙවන්නාගේ ප්‍රකාශනය

දේශීය ආදායම් පනතේ 126(4) වන වගන්තිය ප්‍රකාරව, බදු ගෙවන්නා හෝ බදු ගෙවන්නාගේ නිසි බලය ලද අනුයෝජිතයා, බදු වාර්තාව එහි නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය තහවුරු කරමින් අත්සන් කළ යුතුය. එබැවින්, සමාගමක් සඳහා කළමනාකාර අධ්‍යක්ෂ/අධ්‍යක්ෂ/ලේකම් හෝ ප්‍රධාන නිලධාරියා හෝ වෙනත් අස්ථිත්වයක් සඳහා නියෝජිතයකු, (දේශීය ආදායම් පනතේ 146 වන වගන්තියේ අර්ථ නිරූපණය කර ඇති පරිදි) ආදායම් වාර්තාවේ 2 වන කොටසේ 2 වන අයිතමය යටතේ ඔහුගේ/ඇගේ නම හා තනතුර සඳහන් කරමින් ආදායම් වාර්තාව අත්සන් (හා දිනය) කළ යුතුය.

දේශීය ආදායම් පනතේ 128 වන වගන්තිය ප්‍රකාරව, දේශීය ආදායම් පනත යටතේ යම් තැනැත්තකු හෝ ඔහු වෙනුවෙන් සපයනු ලැබූ ලෙස සැලකෙන සෑම වාර්තාවක්ම, ප්‍රකාශයක්ම හෝ ආකෘතියක්ම පටහැනිව යමක් ඔප්පු කරනු ලැබුවේ නම් මිස, අවස්ථාවෝචිත පරිදි, එම තැනැත්තා විසින් හෝ එම තැනැත්තාගේ බලය පිට සපයනු ලැබූ ලෙස සැලකිය යුතු අතර, එම වාර්තා, ප්‍රකාශ හෝ ආකෘති අත්සන් කරන යම් තැනැත්තකු එහි අඩංගු සියලු කරුණු දන්නා ලෙස සැලකිය යුතුය.

7. පැවරුම් මිල අනාවරණ ආකෘති පත්‍රය.

2021.03.02 දිනැති අංක 2217/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කරන ලද පැවරුම් මිල නියෝග වල 6 වන නියෝගය ප්‍රකාරව, දේශීය ආදායම් පනතේ 76 හා 77 වගන්තිවල සඳහන් පරිදි ආශ්‍රිත ව්‍යවසායන් සමඟ ජාත්‍යන්තර ගනුදෙනුවල නිරත හෝ ගැසට් නිවේදනයේ 1 වන විධිවිධානයේ දක්වා ඇති අවශ්‍යතා සපුරන, ආශ්‍රිත ව්‍යවසායන් සමඟ ජාත්‍යන්තර නොවන ගනුදෙනු වල නිරත තැනැත්තන් ආදායම් වාර්තාව සමග පැවරුම් මිල අනාවරණ ආකෘති පත්‍රය භාරදීම අවශ්‍ය වේ. ඉහතින් සඳහන් කළ ආකෘති පත්‍රය දේශීය ආදායම් වෙබ් අඩවියේ ආදායම් වාර්තා යටතේ දක්වා ඇත.

8. නිශ්චිතව දක්වා ඇති ආදායම් වාර්තා ආකෘති පත්‍රය සඳහා අවශ්‍ය ඇමුණුම්

(i) විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

(ii) නිශ්චිතව දක්වන ලද ආකෘති පත්‍රවල 8 වන උපලේඛනය හෝ බදු ආගණන ප්‍රකාශය

(iii) රඳවාගැනීමේ බදු හෝ අත්තිකාරම් ආදායම් බදු (ඉල්ලුම්කර ඇත්නම්) CSV ආකෘතියට සකස් කළ සත්‍යාපනය කරන ලද (පරීක්ෂා කරන ලද) උපලේඛන (අයිතම සංඛ්‍යාව 20 ට වඩා වැඩි වන්නේ නම්, උඩුගත කිරීම අනිවාර්ය වේ.)

(iv) ගෙවීමක් සඳහා වාර්තාව හෝ වාර්තාවේ කොටසක් සකස් කළ තැනැත්තන් විසින් නිකුත් කළ සහතික

(v) පැවරුම් මිල අනාවරණ ආකෘති පත්‍රය (අදාළ වේ නම්)

(vi) යම් වෙනත් අවශ්‍ය කරන ලේඛන හා සහතික

යම් තැනැත්තකු අදාළ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, අනුමත කළ ආකෘති පත්‍රවල සම්පූර්ණ කළ උපලේඛන, ගෙවීමක් සඳහා වාර්තාව හෝ වාර්තාවේ කොටසක් පිළියෙල කළ තැනැත්තාගේ සහතිකය (අදාළ වේ නම්) නොමැතිව හෝ ආදායමේ ඇස්තමේන්තුගත අගයන් සහිත වාර්තාවක් භාරදීම දේශීය ආදායම් පනතේ කාර්යයන් සඳහා ආදායම් වාර්තාව සපයා නොමැති බවට සලකනු ලැබේ.

9. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ අලාභ ගැලපීම

යම් සමාගමක් ඒ සමාගම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක් ලෙස ක්‍රියාත්මක වූ කාල සීමාව තුළ ව්‍යාපාරයෙන් ලැබූ හිලව් නොකළ (අඩු අනුප්‍රමාණ) අලාභ ඉල්ලුම් කිරීමට අදහස් කරන්නේ නම් ඉල්ලුම් කළ හැකි ප්‍රමාණය පමණක් පළමුව 20.ආ.18 කොටුවට ඇතුළත් කර එකී ප්‍රමාණයම 18% ක හෝ 24% අනුප්‍රමාණය යටතේ 20.ආ.91 හා 20.ආ.21 කොටුවලට ඇතුළත් කරන්න.

අලාභය ප්‍රවර්තන වර්ෂය තුළ උද්ගත වූයේ නම් 18%ක අනුප්‍රමාණය යටතේ 20.ආ.91 හෝ 24% ක අනුප්‍රමාණය යටතේ 20.ආ.21 කොටුවේ ඇති ප්‍රමාණ දෙකෙහිම එකතුව (කාලපරිච්ඡේදය තුළ උද්ගල වූ අලාභය සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ලෙස පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ අලාභය ඇතුළත් කළ යුතුය.

20.ආ.18 කොටුවට ඇතුළත් කර ඇති කල් ඉකුත් වූ අලාභයන් අඩු කිරීමට ඉඩ ලබා නොදේ.

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

10. වාර්තාව භාර දිය යුතු නියමිත දිනය

2021 නොවැම්බර් 30 වන දින ආදායම් වාර්තාව භාරදිය යුතු නියමිත දිනය වේ. එසේ වුවද, පාර්ශව දෙකටම පහසු වන බැවින් එම දිනයට පෙර ඔබගේ ආදායම් වාර්තාව සැපයීමට ඔබට උපදෙස් දෙනු ලැබේ.

11. ඔබට වාර්තාව භාරදිය හැකි ස්ථාන

බදු ගෙවන්නන් විසින් නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ආදායම් වාර්තාව සියලුම ඇමුණුම් සමඟ කොමසාරිස් ජනරාල්වරයා වෙත,

(i) සියලුම උඩුගත කරන ලද ඇමුණුම් ඇතුළුව ඊ-ගොනු කිරීම හරහා ඉලෙක්ට්‍රොනික ක්‍රමයට (සමාගම් හා රාජ්‍ය සංස්ථා සඳහා, එය අනිවාර්ය වේ.)

(ii) "කොමසාරිස්, මධ්‍ය ලේඛන කළමනාකරණ අංශය, පළමුවන මහල, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සර් චින්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන්.

(iii) මධ්‍ය ලේඛන කළමනාකරණ අංශය, පළමු මහල, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ 02 හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඕනෑම ප්‍රාදේශීය හෝ නගරබද කාර්යාලයකට භාරදීමට හැකිය.

12. බද්ද ගෙවීම

දේශීය ආදායම් පනතේ 82 වන වගන්තියෙහි විධිවිධාන පරිදි බදු අය කළ හැකි ආදායම මත බද්ද, රඳවාගැනීම මගින්, වාරික මගින් හෝ තක්සේරු කිරීම මත ගෙවනු ලැබිය යුතුය. දේශීය ආදායම් පනතේ 90 වන වගන්තිය ප්‍රකාරව, 2021/2022 තක්සේරු වර්ෂය සඳහා ත්‍රෛමාසික වාරික පහත දැක්වෙන පරිදි ගෙවා නිබිය යුතුය.

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

වාරිකය	නියමිත දිනය (දින හෝ පෙර)	ගෙවීම් කේතය
1	2021 අගෝස්තු 15	21221
2	2021 නොවැම්බර් 15	21222
3	2022 පෙබරවාරි 15	21223
4	2022 මැයි 15	21224

තක්සේරු ගෙවීම් පහත පරිදි ගෙවා නිබිය යුතුය.

තක්සේරුව	නියමිත දිනය (දින හෝ පෙර)	ගෙවීම් කේතය
ප්‍රාග්ධන ලාභ මත	උපලබ්ධි වන දිනයෙන් මාසයකට පසුව	21040 සිට 22030 (ගනුදෙනුවේ මාසය අනුව කේතය වෙනස් වේ.)
ප්‍රාග්ධන ලාභ නොවන බදු අය කළ හැකි ආදායම මත	2022 සැප්තැම්බර් 30	21220

බදු ගෙවන්නකු නියමිත දිනට බදු ගෙවීමට අපොහොසත් වන විට, නොගෙවූ බදු අයකර ගැනීමට ගන්නා ක්‍රියා මාර්ගයකදී කොමසාරිස් ජනරාල්වරයා විසින් දරන ලද ඕනෑම වියදමකට බදු ගෙවන්නා යටත් වේ.

13. ප්‍රමාද හා අඩුවෙන් ගෙවීම මත පොලී හා දණ්ඩන.

- නියමිත දිනට නොගෙවන ලද බදු මුදලක් වේ නම්, එම ප්‍රමාණය මත. බද්ද ගෙවිය යුතු නියමිත දිනයේ සිට බද්ද ගෙවනු ලබන දිනය දක්වා වන කාලසීමාව සඳහා පොලිය සඳහා බදු ගෙවන්නා යටත් වේ. මාසයකට හෝ මාසයකින් කොටසකට පොලී අනුප්‍රමාණය 1.5% වන අතර එය මාසිකව ගණනය කරනු ලැබේ.
- බදු කාලසීමාව සඳහා ගෙවිය යුතු බද්ද සම්පූර්ණයෙන්ම හෝ කොටසක් ගෙවීමට තැනැත්තකු අපොහොසත්වීම, නියමිත බද්දෙන් 20% කට සමාන දණ්ඩනයකට යටත් වේ. (දේශීය ආදායම් පනත මගින් නියම කර ඇති පරිදි නොගෙවන ලද).

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

තවද, දේශීය ආදායම් පනත යටතේ නියම කරන ලද වාරික ගෙවීමට අපොහොසත් වන්නේ නම්, ගෙවිය යුතු නමුත් නොගෙවන ලද බදු මුදල් ප්‍රමාණයෙන් 10% ට සමාන ප්‍රමාණයක දණ්ඩනයකට යටත් වේ.

14. බදු වාර්තාවක් ගොනු කිරීමට අපොහොසත්වීම මත දණ්ඩන.

2022 නොවැම්බර් 30 දින හෝ එදිනට පෙර, 2021/2022 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාවක් ගොනු කිරීමට අපොහොසත් වන තැනැත්තකු පහත ඒවායින් වැඩි අගය හා සමාන වන දණ්ඩනයකට යටත් වේ.

අ) ගෙවීමට ඇති බදු මුදලින් 5% සමග, ගොනු කිරීමට අපොහොසත්වීම අඛණ්ඩව පවත්නා එක් එක් මාසය හෝ මාසයක කොටසක් සඳහා ගෙවීමට ඇති බදු මුදල් ප්‍රමාණයෙන් 1% සහ

ආ) රුපියල් 50,000/= සහ ගොනු කිරීමට අපොහොසත්වීම අඛණ්ඩව පවත්නා එක් එක් මාසය හෝ මාසයක කොටසක් සඳහා රුපියල් 10,000/= බැගින්.

15. වෙනත් දණ්ඩන නීති විධිවිධාන අදාළ කරගැනීම

(අ) දණ්ඩන

- දේශීය ආදායම් පනතේ 180 වන වගන්තිය ප්‍රකාරව (නොසැලකිලිමත් ලෙස හෝ වංචනිකව අඩුවෙන් කරන ලද ගෙවීම) අසත්‍ය ප්‍රකාශයක් හෝ බදු වාර්තාවක වැදගත් දෙයක් අතහැර තිබීම හේතුවෙන් චේතනාන්විතව හෝ නොසැලකිලිමත් ලෙස බදු අඩුවෙන් ගෙවන (හෝ අඩුවෙන් ගෙවා ඇති) බදු ගෙවන්නන් හට දණ්ඩනයක් පැනවිය හැකිය. අඩුවෙන් කරන ලද ගෙවීමේ ප්‍රමාණය මත දණ්ඩන මුදල පදනම් වේ. අඩුවෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය රුපියල් මිලියන දහයකට වඩා වැඩි වන්නේ නම් හෝ අදාළ කාලසීමාව සඳහා එම තැනැත්තාගේ බදු බැඳීමෙන් 25%කට වඩා වැඩි වන්නේ නම් අඩුවෙන් කරන ලද ගෙවීමෙන් 75% ප්‍රමාණයක දණ්ඩනයකට යටත් විය යුතුය. එසේ නොවන්නේ නම්, දණ්ඩනය අඩුවෙන් කරන ලද ගෙවීමෙන් 25% කි.

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

- දේශීය ආදායම් පනතේ 181 වගන්තිය ප්‍රකාරව (අසත්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශ) බදු නිලධරයකු වෙත අසත්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශ සැපයීම මත දණ්ඩන පනවයි. (180 වන වගන්තිය යටතේ දණ්ඩන පනවා නොමැති නම්) දණ්ඩන මුදල රුපියල් 50,000 ක් හෝ ඒ මත පදනම් ව තක්සේරු කරනු ලැබිය හැකි ප්‍රමාණය යන්නෙන් වැඩි අගයට සමාන වේ. (හෝ ආපසු ගෙවන ප්‍රමාණය අඩු වීම)

- 182 වන වගන්තිය (ලේඛන පවත්වාගෙන යාමට අපොහොසත් වීම) ප්‍රකාරව නිසි ලියවිලි පවත්වාගෙන යාමට අපොහොසත් වීම මත දණ්ඩනය දිනකට රුපියල් 1,000කි.

(ආ) අපරාධ නඩු කටයුතු

- දේශීය ආදායම් පනතේ 187 වන වගන්තිය ප්‍රකාරව (ආධාර දීම හා අනු බල දීම) දේශීය ආදායම් පනත යටතේ අපරාධමය වරදක් සිදු කිරීමට වෙනත් තැනැත්තෙකුට චේතනාන්විතව ආධාර දෙන්නා වූ, අනුබල දෙන්නා වූ, සහාය වන්නා වූ, උපදෙස් දෙන්නා වූ, උනන්දු කරන්නාවූ හෝ පොළඹවන්නා වූ යම් තැනැත්තෙකු වරදකරු කරනු ලබූ විට එම තැනැත්තා විසින් එම වරද සිදුකර ඇති පරිද්දෙන් එම දණ්ඩනයටම යටත් විය යුතුය.

- 189 වගන්තිය (බදු ගෙවීම මඟ හැරීම) ප්‍රකාරව බදු තක්සේරු කිරීම, ගෙවීම හෝ එකතු කිරීම චේතනාන්විතව මගහරිනු ලබන හෝ මගහැරීමට තැත්කරනු ලබන හෝ තැනැත්තකු, වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් 10,000,000 ක දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවනු ලබන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ එම දෙකටම ඔහු යටත් විය යුතුය.

- 190 වන්නිය (බදු පරිපාලනයට බාධා කිරීම) ප්‍රකාරව දේශීය ආදායම් පනත පරිපාලනය කිරීමේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට චේතනාන්විතව බාධා කරනු ලබන හෝ බාධා කිරීමට තැත් කරනු ලබන යම් තැනැත්තකු, වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් 1,000,000 ක දඩයකට, හෝ එක් අවුරුද්දක් නොඉක්මවනු ලබන කාලයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ එම දඬුවම්

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

දෙකටම යටත්වේ. වාර්තාවක් ගොනුකිරීම පැහැර හරිනු ලබන විට, යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් සාවද්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශයක් බදු නිලධරයකු වෙත කරනු ලබන විට, නියම කරන ලද වාර්තා පවත්වා ගෙන යාම පැහැර හරිනු ලබන විට, හෝ අන්‍යාකාරයෙන් බදු නිශ්චය කිරීමට, තක්සේරු කිරීමට හෝ එකතු කිරීමට බාධා කරනු ලබන විට බදු පරිපාලනය කිරීමෙහිලා බාධා කරන ලද බවට සැලකිය යුතුය. අදාල බාධා කිරීම එම තැනැත්තාගේ බද්දක් එකතු කිරීම සම්බන්ධයෙන් නොවුවද, එම තැනැත්තා බදු පරිපාලනයට බාධා කිරීම සම්බන්ධයෙන් වරදකරුවකු වේ.

- වගන්තිය 190 අ වගන්තිය (වංචනික ලෙස සකස් කරන ලද හෝ සහනික කරන ලද ලේඛන) ප්‍රකාරව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා යම් ලේඛනයක් හෝ තොරතුරක් වංචනිකව සකස් කරනු ලබන හෝ ලේඛනයක් වංචනිකව සහනික කරන තැනැත්තෙකු වරදක් සිදු කරන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව රුපියල් 1,000,000 ක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාල සීමාවක් යන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතුය.

මෙම මාර්ගෝපදේශයෙහි සිංහල හෝ දෙමළ පරිවර්තනය දේශීය ආදායම් දෙපාර්තමේන්තු (IRD) වෙබ් අඩවිය - www.ird.gov.lk මගින් බා ගත කළ හැකිය..

දේශීය ආදායම් පනත ප්‍රකාරව ගෙවිය යුතු ආදායම් බදු ගණනය කිරීමේ හා ආදායම් ආකෘති පත්‍ර පිරවීමේ විස්තරාත්මක උපදෙස් දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය www.ird.gov.lk මගින් බා ගත හැක. තවද ඔබට දෙපාර්තමේන්තුවේ යූ-ටියුබ් නාලිකාව (YouTube Channel) වන "INLAND REVENUE DEPARTMENT OF SRI LANKA" මගින් 2021/2022 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාව භාරදීම පිළිබඳ වීඩියෝ පරිශීලනය කිරීමට හැක.

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

වැඩි විස්තර ලබා ගැනීම සඳහා පහත දුරකථන අංක අමතන්න.

1. 1944 - දේශීය ආදායම් ඇමතුම් මධ්‍යස්ථානය
2. 011-2 134 250- ජ්‍යෙෂ්ඨ කොමසාරිස් - ව්‍යාපාර උපදේශන අංශය
3. 011-2 134 205- කොමසාරිස් - සේවා දායක උපකාරක හා ප්‍රවර්ධන අංශය
4. 011-2 134 204 - කොමසාරිස් - ව්‍යාපාර උපදේශන අංශය
5. දේශීය ආදායම් සියලුම නගරබද කාර්යාල හා ප්‍රාදේශීය කාර්යාලවල කොමසාරිස්වරුන්

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk